සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை -2025 / Year End Term Test -2025

ශ්‍රේණිය / தரம் / Grade	11 ශ්‍රේණිය	සිංහල සාහිත්‍ය රසාස්වාදය - I	කාලය / நேரம் / Time	පැය තුනයි.

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

- අමතර කියවීම් කාලය මිනිත්තු 10යි.
- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.

---

1) අංක (i) සිට (v) තෙක් ඇති කොටස් කියවා, ඒවා ඇසුරින් අසා ඇති (අ), (ආ) ප්‍රශ්නවලට කෙටි පිළිතුරු දී ඇති හිස්තැන්වල පමණක් ලියන්න.

i. "මුන් මහණ වන්ට ගිය තැන් පටන් නො දකුම්හ".

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?

.....

(ආ) මෙම ප්‍රකාශය කළේ කා හට ද?

.....

ii. මිනිස් හට සොඳුරු ගුණ සහ නුගුණ ඇත
නිදොස් කෙනෙකු මෙදියත උපදනේ නැත
වෙසෙස් සිනිදු **මුව රද බර** සහස් පත
කොරොස් නළින් යුතු වෙයි කටු පෙළිනි යුත

(අ) මෙහි මුල් කවි පද **දෙකෙහි** අදහස ලියන්න.

.....

.....

(ආ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.

මුව රද බර .....

කොරොස් නළින් .....

iii. "කටේ හැටි කිරි අප්පුගෙ හොඹු කට වගෙයි"

(අ) මෙම ප්‍රකාශය අයත් නිර්මාණයේ නම ලියන්න.

.....

(ආ) මෙම නිර්මාණයේ රචකයාගේ නම ලියන්න.

.....

Past Papers Wiki

iv. මිනිසුන් අතරේ
සමගිය නැති වී
බුදුහාමුදුරුවෝ
එදා අනේ
පාරෙලෙයිය වන
යට වැඩි දා අපෙ
මුත්ත කෙනෙකි
උපකාර වුණේ

(අ) මෙම පද්‍ය පන්තියේ නම ලියන්න.

.....

(ආ) මෙම පැඳි පෙළේ රචකයා කවුද?

.....

v. "මොකද දැන් තීරණේ කර ගත්තෙ. ටැක්නිකල් කොලීජියට අරින්ඩ ද එහෙම නැත්නම්...."

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?

.....

(ආ) මෙම ප්‍රකාශය අසා සිටියේ කවුද?

.....

(ලකුණු 4x5=20යි.)

2) පහත දැක්වෙන ගද්‍ය-පද්‍ය කොටස් දෙකෙන් **එක්** කොටසකට **පමණක්** පිළිතුරු සපයන්න.

මහ බෝධිසත්වයෝ ද ප්‍රභාවතීගේ දැකුමුත් නොලැබ දුබ්භෝජන දුක්ඛසෙය්‍යාදීන් සත් මසක් මුළුල්ලෙහි දුක් විඳත් "මෑගේ දැකුම් විචරකුත් නොලබමි. ඉතා තද පරුෂ ගත් හැඟි වූ මෑගෙන් මට ප්‍රයෝජන කිම් ද මාගේ රටට ගොස් මවුපිය දෙදෙන දැක වාසය කරමි"යි සිතූහ.

එසඳ මනුෂ්‍යලෝකය බැලූ ශක්‍රදේවේන්ද්‍රයෝ කුස රජ්ජුරුවන් සත්මසක් මුළුල්ලෙහි දුක් විඳත් ප්‍රභාවතීන් දැක්ක නොහී උකටලී නියාව දැක ඈ ලැබෙන්ට කිසි කාරණයක් කෙරෙමියි සිතා මදු රජ්ජුරුවන්ගෙන් ගිය දූතයන් බඳු කොට "ප්‍රභාවතී තොම කුස රජ්ජුරුවන් හැරගොස් පියා පලා අවුය, වහා අවුත් උන් කැඳවාගෙන යවයි සත්රජ්ජුරුකෙනෙකුන්ට වෙන වෙනම පත් අසුන් ඇතිව දූතයන් යවූහ. ඔවුන් දැක රජ්ජුරුවෝ සතුටු ව වෙන වෙන ම සිය සෙනහ පිරිවරා සාගල නුවරට අවුත් වටලා ගෙන උනුන් දැක 'තොපි කුමක් නිසා අවුද, තොපි කුමක් නිසා අවුදැ'යි ඔවුනොවුන් විචාරා ප්‍රභාවතීන් නිසා මදු රජ්ජුරුවන් විසින් කැඳවා යවූ හෙයින් ආම්හ'යි යනු අසා "මේ තෙම තමාගේ එක දුව අප සත්දෙනාට ම දේල, මුගේ නොකටයුත්තක් බලව, අප වෙහෙසුයේ යයි දණ්ඩාඝාත විෂඝෝර සර්පයන් පරිද්දෙන් කිපී වෙන වෙන ම අපට ප්‍රභාවතීන් හෝ දෙව, යුද්ධ හෝ කරව"යි පත් අසුන් යවූහ.

ඒ අසා මදු රජ්ජුරුවෝ බලවත් භයපත් ව අමාත්‍යයන් කැඳවා කුමක් කරමෝදැයි විචාළහ. එකළ අමාත්‍යයෝ "දේවයන් වහන්ස, මේ රජදරුවෝ සත්දෙන ප්‍රභාවතීන් නිසා ම අවුය. ඉදින් නුදුනහොත් පවුරු පදනම් වාසල් බිඳගෙන නුවරට වැදගෙන ජීවිතක්ෂයට පමුණුවා රාජ්‍යය හැරගනුම්හයි කියා සේනාව සන්නද්ධ කොට ගෙන යුද්ධාභිමුඛ ව සිටිනාහ. වදිනාට පළමුකොට ප්‍රභාවතීන් යවම්හ"යි කීවාහුයි.

එබස් අසා රජ්ජුරුවෝ "එක් කෙනෙකුන්ට ප්‍රභාවතී පාවා දිනුමෝ නම් තෙස්සෝ යුද්ධ කරන්නාහ. එහෙයින් එක්කෙනෙකුන්ට දී සංහිදවිය නොහැක්ක. මුළු දඹදිව අග්‍රරාජන්ව සිට කුස රජ්ජුරුවන් හැරපියා ආ ගමනට විපාක දක්වමි. මෑ සත්කඩක් කොට කපා රජ දරුවන් සත් දෙනාට දී පියා ගැලවෙම්ව"යි කිවූය.

i. "දුබ්භෝජන දුක්ඛසෙය්‍යාදීන් සත්මසක් මුළුල්ලෙහි දුක් විඳත්" යන්නෙහි අර්ථය ලිහිල් බසින් ලියන්න.

.....

.....

(ල. 04)

ii. මෙම පාඨයේ ඇතුළත් උපමාවක් උපුටා දක්වන්න.

.....

.....

(ල. 04)

iii. කලකිරුණු කුස රජු දුටු ශක්‍රදෙවියන් විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ගය කුමක් ද?

.....

.....

.....

.....

(ල. 06)

iv. සත් රජදරුවන් පිළිබඳ අමාත්‍යවරුන්ගේ කතාව අසා සිටි මදු රජු කළ යෝජනාව කුමක් ද?

.....

.....

.....

.....

.....

(ල. 06)

නැතහොත්

ගොඩේ කන්දේ මූකලාන කම්පා කරමින්නේ
රෑස්සයෙකි රෑ පාළුව බිඳගෙන ඇද වැටුණේ
අඩ නින්දෙ ම පන් පැදුරට උණු කඳුළක් හැලුණේ
මූකලාන පස් වැටියක් වී හීනෙන් පෙනුණේ

යස දරුවන් ගෙන ඇකයෙන් කැපුවන් නොසැලෙන්නේ
දුක් කරදර කෝටියක් ම ගිලගෙන හිනැහෙන්නේ
සියතින් මර විපත කටින මිනිසුන් දකිමින්නේ
මහා පුරුෂයකු වාගේ කන්ද නැගී ඉන්නේ

පිරුණු ලොරිය ගම් දොරකඩ පියමං කර යනවා
පාර වුණත් හිරිහැරයක් නෑ ඔහෙ නිදියනවා
පැලේ වහලා ඇද හැළිලා මාසයක් ම වෙනවා
පරාල තුනකට අයියා හිරේ හුහුං ලනවා

පොරොව, කියත කළුවරේ ම පණ ආවා ලෙසිනේ
මගෙ ඇඟ උඩ පට්ටල් බැඳ කපනු ඉරනු වැන්නේ
දෙයියන්ගේ මල්ලිලාට දෙවියොම රැවටෙන්නේ
කාන්තාර ගම මායිම් තවත් පුළුල් වෙන්නේ

i. "පිරුණු ලොරිය ගම් දොරකඩ පියමං කර යනවා" යන්නෙන් කවියා අදහස් කරන්නේ කුමක් ද?

.....

.....

(ල. 04)

ii. අයියා හිරේ හුහුං ලෑමට හේතුවී ඇත්තේ කුමක් ද?

.....

.....

(ල. 04)

iii. ගම කාන්තාරයක් බවට පත්වීමට හේතුවන කරුණු දෙකක් ලියන්න.

.....

.....

.....

(ල. 06)

iv. කවියා යොදාගත් ආකෘතිය හා භාෂාව පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.

.....

.....

.....

(ල. 06)

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை -2025 / Year End Term Test -2025

ශ්‍රේණිය / தரம் / Grade } 11 ශ්‍රේණිය	**සිංහල සාහිත්‍ය රසාස්වාදය**	කාලය / நேரம் / Time } පැය තුනයි.

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

- **පළමුවන** ප්‍රශ්නය ද **2, 3, 4, 5** ප්‍රශ්නවලින් තෝරා ගත් ප්‍රශ්න **දෙකක්** ඇතුළුව **ප්‍රශ්න තුනකට** පිළිතුරු සපයන්න.
- මෙම පත්‍රය සඳහා පිළිතුරු සැපයීමට පිළිතුරු ලියන කොළ භාවිත කරන්න.

---

1) පහත සඳහන් පැදි පෙළ කියවා, දී ඇති කරුණු කෙරෙහි සැලකිලිමත් වෙමින් රසාස්වාදයක් ලියන්න.

දකුණේ මෙන් ම උතුරෙත් හිරු නහියි — උදේ
රන් තරු රිදී තරු සවසට පෙළට — ඇදේ
හඳ ඇති දාට රසබර රැස් දහර — හදේ
පොල් ගස් මුදුනෙ මෙන් තල්ගස් මුදුනෙ — වැදේ

ගෙන එයි මිහිරි ගී මදනල හමන — විට
වැටහෙයි නො වැටහුණු සැඟවුණු කරුණු — මට
නිල් පැහැයක් නැතත් මේ වැලි පොළොව — පිට
උදයට පෙනේ බොල් පිනි බිඳු පබලු — ඇට

තනි බව දැනේ එහි කවුතුක රසය — ඇත
මා පිට ගෙයක බව සලකනු පුරුදු — නැත
හැම මොහොතක ම ඇති උණුසුම් ගතිය — මත
උගනිමි කිමද මිනිසා සතු දෙ නෙත — තෙත

ඩහදිය හෙළන අය හිරිහැර අතර — වැටී
දකුණේ මෙන්ම උතුරෙත් හැම තැනම — සිටී
විමසා බලමි ඔවුනගේ හදවතෙහි — හැටී
කළුගල් යකඩ නො ව උණු වී හැළෙන — ඉටී

බැඳ ඇති විලංගුව පා මිණි සළඹ — කොට
සලකා වැටෙන එය බැන්දහු ඉදිරි — පිට
මිනිසුන් දකුණෙ මෙන් උතුරෙත් පෙනෙන — විට
සිහියෙන් තුරන් වෙයි හෙට යන දවස — මට

මිනිහා වෙතින් මිනිහා වෙන් කරන — රිසින්
බැඳ ඇති පවුරු පදනම් කිසි කෙනෙකු — විසින්
ඒවා කඩා බිඳගෙන එහි පිරුණු — පසින්
පාලම බැඳෙනු ඇත දවසක උතුරු — දෙසින්

PAST PAPERS WIKI

පැයකදි එකට හමුවන දුර ඇත	දෙතැන
මෙය වෙන් කරනු හැකි කිසිවෙකු වෙද	කොතැන
සුරුට්ටුවට එක් වී උතුරේ	ඔතන
බෙදය පිළිස්සී හමු වේවා	දකුණ

- කවියට පාදක වී ඇති තේමාව
- සියලු ම මිනිසුන් සමාන බව
- සමගිය බිඳීමට කවුරුන් හෝ වෑයම් කරන අයුරු
- කවියාගේ ප්‍රාර්ථනා
- ආකෘතිය හා බස් වහර

(ලකුණු 6x5 =30යි)

2) අවස්ථා හා සිද්ධි මනාව නිරූපණය කිරීම නිසා වැලපීම කෙටිකතාව සාර්ථක වී ඇත. නිදසුන් **තුනක්වත්** දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15යි)

3) කිඹුල්වත් නුවරට වැඩි බුදුන් වහන්සේ එහිදී බොහෝ දෙනාට පිහිට වූ අයුරු නන්ද මහ තෙරුන් වහන්සේගේ වස්තුව මඟින් ඉදිරිපත් කර ඇත. නිදසුන් **තුනක්වත්** දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15යි)

4) "මඟ" පද්‍ය පන්තිය මඟින් අපූර්ව ජීවන දෘෂ්ටියක් ලබා දී ඇත. නිදසුන් **තුනක්වත්** දෙමින් විමසන්න.

(ලකුණු 15යි)

5) චිත්ත රූප මැවෙන භාෂාවක් භාවිත කරමින් තම අදහස ඉදිරිපත් කිරීමට ගත් උත්සාහය දිසාපති කාමරයේ දී ය" පද්‍ය පන්තිය ඇසුරෙන් උදාහරණ **තුනක්වත්** දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15යි)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank